පුරප්පාඩු පිරවීම

වත්තල මාබෝල නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වත්තල මාබෝල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු අංකය	**තනතුරේ නාමය**	**වැටුප් පරිමාණය**
01	කම්කරු	රු. 25790-10x270-10x300-10x330-12x350-38990
02	සෞඛ්‍ය කම්කරු	රු. 24250-10x250-10x270-10x300-12x330-36410
03	වැඩ ක්ෂේත්‍ර කම්කරු	රු. 24250-10x250-10x270-10x300-12x330-36410
04	රියදුරු	රු. 25790-10x270-10x300-10x330-12x350-38990

02. වැටුප

රා.ප.ච. 03/2016 හි උපලේඛන 11 සඳහන් පරිදි ගෙවීම සිදු කරනු ලැබේ.

03. අධ්‍යාපන සුදුසුකම්

I. කම්කරු (III ශ්‍රේණිය) - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

a. ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී භාෂාව ඇතුළු විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතු අතර, විෂයයන් 03 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

සහ

b. විදුලි කම්කරු තනතුරට අදාළව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය)

කම්කරු - (III ශ්‍රේණි) බාහිර අයදුම්කරුවන් සඳහා

a. ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී භාෂාව ඇතුළු විෂයයන් දෙකක් සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතු අතර, විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුයි.

සහ

b. තනතුරට අදාළව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය)

II. සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය)

අවම වශයෙන් 8 වන ශ්‍රේණිය / 09 වසර සමත් වී තිබිය යුතුය.

III. වැඩ ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය)

අවම වශයෙන් 8 වන ශ්‍රේණිය / 09 වසර සමත් වී තිබිය යුතුය.

IV. රියදුරු (III ශ්‍රේණිය)

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව ඇතුළු සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් 03 ක් අවම වශයෙන් සමත්ව තිබිය යුතුය)

04. වෘත්තීය සුදුසුකම්

I. කම්කරු

a. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 03 වන මට්ටමේ සහතිකය තිබීම

හෝ

b. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම

හෝ

c. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

d. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම

හෝ

e. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම

හෝ

f. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

II. රියදුරු

a. පෞද්ගලික / කුලී රථ සහ භාර බර කොන්ඩර් 24 ට අඩු ස්වයංක්‍රීය වර්ගයේ රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 ක ට පෙර අවම වශයෙන් බී සහ බී 01 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)

b. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

(සංලක්ෂය - ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාවය සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බලපත්‍රය (භාර බර කොන්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් ඒ 1 සහ සී 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රයක් නැතහොත් භාර බර කොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම් වශයෙන් නියම කිරීමට පත්කිරීම් බලධාරියා කටයුතු කරනු ඇත.

05. පළපුරුද්ද

a. **රියදුරු**

බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)

III. කායික සුදුසුකම්

a. **රියදුරු**

අවම උස අඩි 05 ක් විය යුතුය. තවද දිවා කාලයේ හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

06. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය

II. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.

III. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජය හෝ පළාත් සභා විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලටද අනුකූලව ක්‍රියාත්මක කිරීමට සේවකයින් බැඳී සිටිය යුතුය.

07. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උපාධියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

VI. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම

I. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

II. අයදුම්කරුවන් තමා විසින්ම සකසා ගත් අයදුම්පත්‍රයක් 2017.04.24 දිනට පෙර ලැබෙන සේ **ලේකම්, වත්තල මාබෝල නගර සභාව, වත්තල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

IV. තනතුරු කීපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

V. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

a. උප්පැන්න සහතිකය

b. අධ්‍යාපන සහතික

c. පදිංචිය සහතික කිරීම පිණිස මාස 03 ක් ඇතුළත ලබාගත් පදිංචිවීමේ සහතිකය

d. මෑතකදී ලබාගත් චරිත සහතික 03 ක් (මින් එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය)

VI. නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අනාගතයේදී බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම දැන්වීම අවලංගු කිරීමේ බලතල වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

10. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

11. අයදුම්කරු විසින් සපයන තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරු නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගත හොත් කිසිදු වන්දියක් හෝ නොගෙවා සේවයෙන් පහ කිරීමට කටයුතු කිරීමේ බලතල වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

ඩී.පී.එච්. සමරවික්‍රම,
ලේකම්,
වත්තල මාබෝල නගර සභාව.